සාංඝික දානය

දොළොස්වල උදිතධීර හිමි

'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'

"යජමානං මනුස්සානං
පුඤ්ඤපෙක්ඛාන පාණිනං
කරෝටං කෝපදිකං පුඤ්ඤං
සංඝෙ දින්නං මහප්ඵලානි"

වාසනාවන්ත සත්පුරුෂ පින්වන්ති අද ධර්ම දේශනාව සඳහා මම මාතෘකා කර ගත්තේ අපි නිතරම කරන පින්කමක් පිළිබඳව. ඒ තමයි සඟසතු මහා දානය සාංඝික දානයක් ගැන අපි දත යුතු කාරණා මොනවාද? ඒක පිළිබඳ තමයි අද මගේ ධර්ම දේශනාව.

ඇත්තටම සාංඝික දානය කියලා කියන්නේ දානයන් අතර තිබෙන ඉතාම විශිෂ්ඨ වූ දානයක්. සාංඝික දානය දෙවෙනි වෙන්නේ දාන කීපයකට විතරයි. ඒ තමයි ආවාස දානය. සාංඝික දානය දෙවැනි වෙනවා ආවාස දානය ඊට වඩා අග්‍රයි. ඊළගට ධර්ම දානයට සඟසතු දානය දෙවැනි වෙනවා. ධර්ම දානය සියලු දානයන්ට වඩා අග්‍රයිනේ. ඒ කියන්නේ කඨින පූජාවකටත් වඩා අග්‍රයි, ධර්ම දානය. කඨිනයක් පූජා කරන එක අපේ ජීවිතයේ අපි ලබන ලොකු පින්කමක්නේ. ඊටත් වඩා අග්‍රයි ධර්මදානමය පින. ඒකයි සබ්බදානං ධම්මදානං ජිනාති කියලා කිව්වේ. ඉතින් කඨින පින්කම් කරන හැමදෙනාම සිදු කරනවනේ ඊට සමගාමීව ධර්ම දානමය පින්කම්. ඉතින් ඒ තමයි සඟසතු දානය දෙවැනිවන දානය. ඊළගට සාංඝික දානය තව දෙවැනි වෙනවා අපි කව්රුත් හිතන්නේ නැති පින් කමකට. අපි හිතන්නෑ ඒක සඟසතු දානයට වඩා ශ්‍රේෂ්ඨයි කියලා. ඒ තමයි බුද්ධ පූජා දානය. ඒ සාංඝික දානයට වඩා වටින තව පින්කම් තියෙනව. මෛත්‍රී භාවනාව, ඒ වගේම අනිත්‍ය භාවනාව

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

ඒ වගේ දේවල්. ඊළඟට සාංඝික දානයට වඩා වටිනවා බුද්ධ පූජා දානය ගොඩක් අය ඒක දන්නේ නැහැ. ගොඩක් ඇත්තෝ හිතන්නේ බුද්ධ පූජා දානයට වඩා සඟසතු දානය වටිනව කියල. ඒ කියන්නේ අපේ ගෙදර අපිට පුළුවන් හැම දවසකම බුද්ධ පූජාව තියලා සාංඝික දානමය පිනකට වඩා පිනක් කරගන්න. ඔය දක්ඛිණ විභංග සූත්‍රයේ තමයි දාන පිළිබඳ විස්තර සඳහන් වෙන්නේ. ඒ විස්තරේ දී කියනව බුද්ධ පූජා දානයමයි අග්‍ර. අට්ඨ කතාවේ කියනව ඇයි අග්‍ර, ලෝකයේ බුදුරජාණන් වහන්සේට සම කරන්න පුළුවන් සීලවන්ත කෙනෙක් ගුණවන්ත කෙනෙක් කව්රුත් නැහැ. සියලුම රහතන් වහන්සේලාගේ දැනුම එක්තැන් කලත් ඒ දැනුම තථාගතයන් වහන්සේගේ සර්වඥතා ඥාණයට සියල්ල දන්න නුවනට සමාන කරන්න පුළුවන්කමක් නැහැ. එහෙනම් අතීත, අනාගත, වර්තමාන කියන තුන් කාලයටම අයිති ශ්‍රාවක පිරිසට වඩා ගුණවන්තයි. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තුන් කාලයටම අයිති සඟ පිරිසගේ ගුණය එකතු කළොත් ඒ බුදුරජාණන් වහන්සේගේ ගුණයට සමාන කරන්න බෑ. ඒක නිසා බුද්ධ පූජා දානය ලෝකේ ඉතාම අග්‍රයි දානයන් අතර. ඒක නිසා දානයන් අතර ඔන්න ඔය දානයන්ට විතරයි සඟසතු ආහාරපාන දානය දෙවැනි වෙන්නේ.

බලන්න ආවාස දානයට, ධර්ම දානයට, බුද්ධ පූජා දානයට ඊළඟට සමථ භාවනාවෙන් ලැබෙන කුසලයට, ඒ වගේම විදර්ශනා භාවනාව වැඩීමෙන් ලැබෙන කුසලයට ඔවට විතරමයි සාංඝික දානය දෙවැනි වෙන්නේ. එච්චර අග්‍රයි සඟසතු මහා දානය. සඟසතු දාන කීයක් තිබෙනවද? මං හිතන්නේ ඔබ අහල ඇති කීයද? සාංඝික දාන දෙන්න පුළුවන් ක්‍රම තියෙනව හතක්. සඟසතු දාන ඔක්කොම හතක් තියෙනව. පළවෙනි සඟසතු දානය තමයි බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කාලයේ දී බුදුරජාණන් වහන්සේ වැඩම කරල උන් වහන්සේට එක් බිත්තියක ආසනයක් පනවල ඒ වගේම අනිත්

පැත්තේ බිත්තියේ භික්ෂු සංඝයා වාඩි කරල අනිත් පැත්තේ බිත්තියට වෙන්න භික්ෂුනී සංඝයා වාඩි කරවල සාංඝික කරල මහා දන් දෙනව. බුද්ධ ප්‍රමුඛ භික්ෂු භික්ෂුනී උභය සංඝයාට දන් දෙනව ඒ තමයි පළවෙනි සඟසතු මහා දානය. තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු බුදුරජාණන් වහන්සේ වෙනුවට මැද ආසනයක් පනවල බොහොම ගෞරවනීය විදිහට බුද්ධාසනයක් පනවල ඒ ආසනය මත ධාතු තැන්පත් කරපු චෛත්‍යයක් හරි ප්‍රතිමා වහන්සේ නමක් හරි වඩා හිඳුවල ඒ ආසනය ඉදිරි පිට මේසයක් තබල අර මහා සංඝයාට තියන හැම එකක්ම ඒ විදිහටම ඒ මේසෙ මත තැන්පත් කරල එක් පසකින් භික්ෂුනීන් වහන්සෙල ද අනික් පසින් භික්ෂූන් වහන්සෙල ද වාඩි කරල අර පළවෙනි සාංඝික දානයට බුද්ධ පරිනිර්වානයෙන් පසු දෙන්න පුළුවන් කියල අට්ඨ කතාවේ සඳහන් වෙලා තියෙනව. ඒ තමයි පළවෙනි සඟසතු මහා දානය.

ඊළඟට දෙවැනි සාංඝික දානය ඒ තමයි තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු භික්ෂු සංඝයායි භික්ෂුනී සංඝයායි වැඩම කරවල දන් පැන් පූජ කරනව සාංඝික කරල. ඒ තමයි දෙවනි සාංඝික දානය. පළවෙනි සාංඝික දානය අදකාලේ අපිට දෙන්න පුළුවන් ද? බැහැ. දෙවැනි සාංඝික දානය අපිට අද දෙන්න පුළුවන් ද? භික්ෂු භික්ෂුනී කියන උභය සංඝයා වැඩම කරවල ඒ දානය අපිට දෙන්න පුළුවන් කියල ද කියන්නේ? මම දන්න තරමට නම් බැහැ. ඇයි භික්ෂුනී සංඝයා ලෝකය තුල නැති නිසා භික්ෂුනී සාසනය ලෝකේ අතුරුදහන් උනේ අනුරාධපුර යුගයේ දී සාසන ඉතිහාසයට අනුව. ඊට පස්සේ ථෙරවාදී භික්ෂුනී සාසනය ථෙරවාදී කිසිම බෞද්ධ රටක් තුල වාර්ථා වෙන්නේ නැහැ. ථෙරවාදී බෞද්ධ රටවල් කිහිපයයිනේ තියෙන්නේ. ඉස්සර බුරුමය දැන් මියන්මාරය ඊළඟට තායිලන්තය. ප්‍රධාන ථෙරවාදී බෞද්ධ රටවල් දෙකයි. ලංකාව ඇරුනහම තව ඉතින් පිරිහුනු මට්ටමට ථෙරවාදී දහම ටිකක්

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

තියෙනව බංගලාදේශය, නේපාලය වගේ රටවල් කිහිපයකත්. නමුත් ඔය කිසිම රටක භික්ෂුනීන් වහන්සේල පිළිබඳ සඳහන් වෙන්නේ නැහැ.

ඒක නිසා දැනට ලෝකේ භික්ෂුනී සාසනය නැත. මහායාන භික්ෂුනී සාසනය තියෙනව. ඒ මහායාන එකෙන් අපේ රටට ගෙනල්ලත් තියෙනව භික්ෂුනී සාසනය. චීනය භික්ෂුනීන් වහන්සේලාගෙන් උපසම්පදාව ලබාදීල ඉන්දියාවට එක්කර ගෙන ගිහිල්ල ලංකාවට ගෙනත් තියෙනව. නමුත් ඒක අපේ ථෙරවාදි ශාසනය නෙමෙනේ. මොකද මහායාන භික්ෂුනී සාසනය හාත්පසින් වෙනස් වූ එකක්නේ. බුදුරජාණන් වහන්සේම දේශනා කලා භික්ෂුනී සාසනය අතුරුදහන් උවහොත් පිහිටුවිය හැකි ක්‍රම දෙකකි. පළවෙනි ක්‍රමය තමයි උපසම්පදා භික්ෂුන් වහන්සේලා හතර නමක් ලිංග විපර්යාසයකට කාන්තාවන් බවට පත් උවහොත් ඒ භික්ෂුන් වහන්සේලාගේ වස් ඒ විදිහටම ද උපසම්පදාව අහෝසි නොවී ඒ විදිහටම පිහිටනව. උන් වහන්සේල භික්ෂුනීන් වෙනව. ඒ හතර නමට පුළුවනි කාන්තාවන් පැවිදි කරල උපසම්පදා කරන්න කියල දේශනා කලා. ඒ උපසම්පදාව පිහිටන්න පුළුවන් පළවෙනි ක්‍රමය.

දෙවැනි ක්‍රමය තමයි ආයෙමත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙනෙක් ලෝකේ පහල වෙන්න ඕනි. ලොව්තුරා බුදු කෙනෙක් ලෝකේ පහල වෙලා ඒ බුදුරජාණන් වහන්සේට පුළුවනි භික්ෂුනී ශාසනය නැවත ආරම්භ කරන්නට. ඉතින් අපේ ලංකාද්වීපය තුල වැඩ සිටිනව දස සිල් මාතාවන්. දස සිල් ආරක්ෂා කරමින් අනගාරික ජීවිතයක් ගත කරමින් දසසිල් මාතාවන් වැඩ සිටිනව. එසේ උවත් අපේ රට තුලවත් ලෝකේ තුලවත් ථෙරවාදී භික්ෂුනී සාසනය පවතින්නේ නැත. ඒක නිසා පළවෙනි සාංඝික දානය දෙන්නත් බෑ අපිට දෙවැනි සඟසතු දානය අද කාලේ දෙන්න පුළුවන් කමකුත් නැහැ.

ඊළඟ එක තමයි තුන්වන සාංඝික දානය. ඒ මොකක් ද? ඒ තමයි **'භික්ඛු සංඝෙ දානං දේති'** භික්ෂූන් වහන්සේලාට විතරක් සඟසතු කොට මහා දන් දෙනව. ඒ කියන්නේ මහා සංඝ රත්නය විතරක් වැඩම කරවල සාංඝික දන් දෙනව. හැබැයි මේ දානේ විශේෂයක් තියෙනව. අපි දෙන දානය මේ සාංඝික දානයට ඇතුලත් වෙන්නේ නැහැ. භික්ෂූන් වහන්සේලා වැඩම කරවල අපි දෙන දානය ඇතුලත් වෙන්නේ නැහැ. ඇයි, අපි දෙන දානය ඇතුලත් වෙන්නේ නැත්තේ. මෙ කියන තුන්වන සාංඝික දානයේ දී භික්ෂූන් වහන්සේල ගණන් දක්වන්නේ නැහැ. පස් නමක් ද දොලොස් නමක් ද සිය නමක් ද? අද කාලේ පංසලකවත් මේ දානේ කෙරෙන්නේ නැහැ. පංසලක කළත් සිය නමක්, විසිනමක්, තිස් නමක්, හැට නමක් කඨිනයක් කලත් එහෙමනේ ගණන් හිතා ගන්නවනේ මේ තුන්වන සාංඝික දානය ඒකට අදාල වෙන්නේ නැහැ. ඒ කියන්නේ ගණන් නැතුව ඉන්න තරමක් ස්වාමීන් වහන්සේල පංසලකට ආරාධනා කළොත් ඒ පංසලේ ඉන්න තරමක් භික්ෂූන් වහන්සේලා ඒ පන්සලට එදා දවසට වැඩියොත් භික්ෂූන් වහන්සේල ඒ තරමට භික්ෂූන් වහන්සේල ගණන් කියන්නෑ එක නමක් ආවත් දායකය බොහොම සතුටුයි. මම සංඝයා ඉන්න තරමකට ආරාධනා කළේ, එක නමයි නම් ඉන්නේ එකෙන් සතුටු වෙනව, දෙනමක්නම් ඉන්නේ දෙනමගෙන් සතුටු වෙනව, දහ නමක් වැඩියොත් එහෙම ඒත් සතුටු වෙනව අන්න එහෙම ඉන්න තරමකට ආරාධනා කරල දෙන දානය තමයි තුන්වන සාංඝික දානය.

ඊළඟට හතරවෙනි සාංඝික දානය තමයි භික්ෂුනී සංඝයාට ආරාධනා කොට දෙනු ලබන දානය. භික්ෂුනී ආරාමයකට ගිහිල්ල භික්ෂුනී සංඝයාට ආරාධනා කරනව ඔබ වහන්සේල ඉන්න තරමක් වඩින්න අපේ ගෙදර දානයට. ඒත් එහෙමයි ගණන් කියන්නේ නැහැ. ගණන් කියන්නේ නැතුව ඉන්න තරමක් වැඩම කරගෙන

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

ඇවිල්ල දානය පූජා කිරීම ඒ තමයි හතරවෙනි එක. ඊළඟට පස්වෙනි සාංඝික දානය. ඒ පස්වෙනි සාංඝික දානය තමයි භික්ෂූන් වහන්සේලා මෙපමණය. භික්ෂුනීන් වහන්සේලා මෙපමණය. කියල ගණන් වශයෙන් තීරණය කරල දෙන සඟසතු දානය. භික්ෂූන් වහන්සේලා පහලොස් නමයි භික්ෂුනීන් වහන්සේලා පහලොස් නමයි. ඔන්න ඔය විදිහට ගාණක් තීරණය කරනව. උභය සංඝයා ගෙන්ම ගාණක් තීරණය කරල ඒ ගණන් වශයෙන් තීරණය කරල ඒ සඟසතු දානය පූජා කරනව. ඒ එතකොට කී වෙනි එකද? පස් වෙනි එක ඒකත් අපිට කරන්න බැනේ.

ඊළඟට හයවෙනි එක. හයවෙනි එක තමයි භික්ෂු සංඝයා විතරක් ගණන් කරල මෙන්න මෙච්චර ස්වාමීන් වහන්සේල ඔනි කියල ගාණක් වශයෙන් ආරාධනා කරල පස් නමක් හෝ දහ නමක් හෝ සිය නමක් හෝ කියල ආරාධනා කරල සාංඝික දානය පූජා කිරීම හත්වෙනි එක තමයි. භික්ෂුනී සංඝයා ගණන් වශයෙන් ආරාධනා කරල සඟසතු දානය පූජා කිරීම ඔන්න සාංඝික දාන හතයි. මෙතෙන් අද දෙන්න පුළුවන් දාන බොහොම සීමිත ප්‍රමාණයක්. එකක් තමයි අද දෙන්න පුළුවන් ඉන්න තරමක් භික්ෂූන් වහන්සේලාට වඩින්න කියල අන්න ඒ දෙන දානය දෙන්න පුළුවන් කම තියෙනව. ඒ වගේම භික්ෂූන් වහන්සේල ගණන් වශයෙන් ආරාධනා කරල දෙන දානය දෙන්න පුළුවන් කම තියෙනව. මේ දාන දෙක විතරයි අදකාලේ දෙන්න පුළුවන් කම තියෙන්නේ සාංඝික පින්කම් අතරින්. ඊළඟට මම ඔබෙන් ප්‍රශ්ණයක් අහන්නම්. සාංඝික දානයක දී වැඩිපුරම සහභාගි වෙන්න ඕනි සාමණේර භික්ෂූන් වහන්සේලා ද උපසම්පදා භික්ෂූන් වහන්සේලා ද? කවුද වැඩියෙන් සහභාගි වෙනවනම් හොඳ? උපසම්පදා භික්ෂූන් වහන්සේලා. ඊළඟට ප්‍රශ්ණය සාංඝික දානයට අවම වශයෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේල කී නමක් සිටිය යුතු ද? අඩුම ගානේ පස් හය නමක්.

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

සාමණේර භික්ෂූන් විතරක් වැඩම කළොත් දානයට ඒ දානය සාංඝික දානයක් බවට පත්වෙනව ද? පත්වෙන්න පුළුවන් ද? පත් වෙන්න බැහැ. මං මේ ඔක්කොම කිව්වේ මේ අයගේ පිළිතුරු. මයාල කියන පිළිතුරු ඔක්කොටම ඇහෙන්නේ මේ ශබ්ධ විකාශන යන්ත්‍රයෙන් නැවත ප්‍රකාශ කලා විතරයි. අපි දන් බලමු මේ ප්‍රශ්ණ වලට මඹ දීපු පිළිතුරු හරි ද වැරදි ද කියල. පළවෙනි ප්‍රශ්ණය සාංඝික දානයට වැඩිපුර සිටිය යුත්තේ උපසම්පදා භික්ෂූන් ද? සාමණේර භික්ෂූන් ද? ඒකට පිළිතුර තමයි. එහෙම එකක් නැහැ. උපසම්පදා භික්ෂූන් වැඩිය හිටියත් කමක් නැහැ සාමණේර භික්ෂූන් වැඩිය හිටියත් කමක් නැහැ. ආයේ අනිවාරයෙන් උපසම්පදා අය ඉන්න ඕනි ප්‍රමාණයක්වත් සාමණේර අය වැඩියෙන් ඉන්න හොඳ නෑ කියලවත් එහෙම එකක් නැත. මන්න පළවෙනි ප්‍රශ්නෙට පිළිතුර. ඉතාම හොඳින් මතකේ තියා ගන්න දානේ සාංඝික කරන කොට සාමණේර හාමුදුරුවරු ගොඩක් ආවත් කමක් නැහැ උපසම්පදා හාමුදුරුවො ගොඩක් ආවත් කමක් නැහැ. ආපු පිරිසෙන් වැඩි පිරිසක් සාමනේර උනාට ප්‍රශ්නෙකුත් නැහැ. වැඩි පිරිසක් උපසම්පදා උනාට ප්‍රශ්නෙකුත් නැත.

ඊළඟ ප්‍රශ්නය සාංඝික දානයකට අඩුම ගානේ උපසම්පදා ස්වාමීන් වහන්සේල කී නමක් සිටිය යුතුද? සමහර අය කිව්ව හත් නමයි, සමහර අය කිව්ව පස් නමයි. තව එක්කෙනෙක් කියනව ඇහුන එක නමක් හිටියත් ඇති කියල. එක නමකින් සාංඝික කරන්න පුළුවන් ද? බැහැ කියල මෙයාල පිළිතුරු දෙනව ඒකත් එයාලගේ පිළිතුරක්. මම තාම ඒකට පිළිතුරු සපයා දුන්නේ නැහැ. කොහොමහරි හිතනව මිනිස්සු සාමාන්‍යයෙන් අඩුගානේ පස් නමක්වත් ඉන්න ඕනි සාංඝික කරල පූජා කරන්නනම් කියල. ඇයි මේ හිතන්නේ මෙහෙම බුද්ධ ශාසනයේ පස් නමක් ඕනි වෙන්නේ උපසම්පදාවක් කරන්න. ඇයි බුදුරජාණන් වහන්සේ උපසම්පදාවක්

පස් නමකගෙන් කරන්න අවසර දුන්නේ. පස් නමක්වත් හොයා ගන්න එක සමහර ප්‍රදේශවල අමාරුයි. ඒක නිසා බුදුරජාණන් වහන්සේ කිව්ව අඩුම ගානේ උපසම්පදා භික්ෂූන් වහන්සේල පස් නමක් හොයාගෙන ඒ පස් නමකගෙන් උපසම්පදා විනයකර්මය කරන්න පුළුවනි. අනෙක් විනය කර්ම ඔක්කෝමත් කරන්න පුළුවන් බැරි එකම එක විනය කර්මයයි තියෙන්නේ. ඒ තමයි අබ්භාන විනය කර්මය කියල එකක්. ඒක ඇරුනම පස් නමකගෙන් ඕනම විනය කර්මයක් කරන්න පුළුවන් ඒ පස් නමක්වත් හොයා ගන්න අමාරු නිසා තමයි උපසම්පදාවට පස් නමක් තිරණය කළේ.

ඉතින් උපසම්පදා කරන්න පස් නමකුත් හොයා ගන්න අමාරු නම් සාංඝික දාන දෙන්න පස් නමක් හොයා ගන්න ලේසිද? අදකාලේ අපිට ටිකක් ලේසියි අපිට වාහන එහෙම තියෙන හන්ද. ඒ කාලේ එහෙම කරන්න පුළුවන් කමක් තිබුනේ නැහැ. ඒක නිසා සාංඝික දානයට ස්වාමීන් වහන්සේල ප්‍රමාණයක් දක්වා නැත. අපි හිතන්නේ සංඝ කියන්නේ හතර නමක් හෝ ඊට වැඩි භික්ෂු පිරිසක් කියල. ඇත්තටම විනය කර්මවල දී සංඝ කියල කියන්නේ හතරනමක් හෝ ඊට වැඩි භික්ෂු පිරිසක් ඉන්න ඕනි විනය කර්මවල සංඝ කියල කියන්නේ **'ඤත්ති චතුත්ථ කර්මයෙන්'** උපසම්පදාව ලද භික්ෂූන් වහන්සේල හතර නමකට හෝ ඊට වැඩි පිරිසට **ඤත්ති චතුත්ථ කර්මය** කියල කියන්නේ දැනට පවතින උපසම්පදා කරන ක්‍රමය මම ඒක ගැන කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කොහොම හරි දැනට පවතින උපසම්පදාවෙන් උපසම්පදා වූ භික්ෂූන් වහන්සේල හතර නමක් තමයි විනය කර්මවලදී සාංඝික දානයේ දී සංඝ කියල කියන්නේ. අර උපසම්පදා ඤත්ති චතුත්ථ කර්මෙන් උපසම්පදා වෙච්ච ස්වාමීන් වහන්සේලාට විතරක් නෙමේ සාංඝික දානයේ දී සංඝ කියල කියන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේල හතර නමක් නොවෙයි. ඒකෙදි සංඝ කියල කියන්නේ අතීතයේ වැඩසිටි සියලු

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

සාමණේර උපසම්පදා ආර්ය අනාර්ය සියලු මහා සංඝ රත්නය. සංඝ කියල කියන්නේ උපසම්පදා හතර නම විතරක් නෙමෙ වර්තමානයේ ලොව පුරාම වැඩ සිටින සියලුම භික්ෂූන් වහන්සේලට . ඊළඟට බුද්ධ ශාසනය ලොව තුල පවතින තාක්කල්ම බුද්ධ ශාසනයේ පහලවන සාමණේර උපසම්පදා සියළු භික්ෂූන් වහන්සෙලට අන්න සාංඝික දානයේ දී සංඝයාට දෙනව කියන්නේ. උපසම්පදා භික්ෂූන් වහන්සෙල හතර නමට හෝ ඊට වැඩි ගානට දෙනවා කියන එක නෙමෙ ඒක වරද්ද ගන්න හොඳ නෑ. සංඝයාට දෙනව කියල කියන්නේ තුන් කාලයටම අයිති මහා සංඝයාට පූජා කරනව කියන එකයි. ඒක නිසා උපසම්පදා භික්ෂූන් වහන්සේල මෙන්න මෙච්චර ඉන්න ඕනි කියල අවශ්‍යතාවයක් නැහැ. තුන් කල්හිම ඉන්න මහා සංඝයාට නිසා සාමණේර අයත් අයිතියිනේ. ඕනිනම් සාමණේර කිහිප නමක් විතරක් වැඩම කරගෙන ගිහිල්ල සාංඝික දානේ දෙන්න පුළුවනි.

ඊළඟ ප්‍රශ්ණය සඟසතු දානයට අපි කිව්වේ උපසම්පදා පස් නමක් ඉන්න ඕනි සාමණේර ඉන්න ඕනි ගානක් කිව්වේ නැනේ. මම මේ අහන්නේ ඊළඟ ප්‍රශ්ණය සාමණේර හෝ උපසම්පදා හෝ ඕනෑම භික්ෂු පිරිසකට තනි භික්ෂු පිරිසකට හෝ සාමණේර භික්ෂු පිරිසකට විතරක් උනත් සඟසතු දානය දියහැකි බව අපි ප්‍රකාශ කලා. පැහැදිලි කරල දුන්න ඒකේ වෙනසත් කියල දුන්න. මොකද් ද මේ සංඝ කියන මේ විනය කර්මවල සංඝ කියන්නේ කාටද? අපි ඉලක්ක කරන්න ඕනි සංඝයා කව්ද? ඒක පැහැදිලි කරල දුන්න. දැන් ඊළඟ ප්‍රශ්ණය සාමණේර හාමුදුරුවො හරි උපසම්පදා හාමුදුරුවරු හරි අඩුම ගානේ කී දෙනෙක් ඉන්න ඕනි ද දානය සාංඝික කරන්න. දැන් මම කිව්වනේ සාමණේර උපසම්පදා ප්‍රශ්ණයක් නෑ උපසම්පදා පස් නමක් ඉන්නනම් ඕන නෑ කියල කිව්වනේ. කී නමක්වත් ඉන්න ඕනිද? අඩුම ගානේ එක නමක්

හිටියත් ඇති. ඇත්තටම ඉන්න ඕනි ස්වාමීන් වහන්සේල ගණනක් හරියටම නැත. එක නමක් හිටියත් ඇති. හැබැයි එක නම මේ ආරාධනාව කරන්න ඕනි කොහොම ද? සාංඝික දානයේ ආරාධනා කරන්න ඕනි සඟින් ආරාධනා කළ යුතුයි. දූන් දෙන දාන සාංඝික ද කියල හිතා ගන්නත් බෑ. ඇත්තටම ඒ මොකද? මේ දේශනාව කෙලවර ටිකක් ඔබට තේරෙයි. දානයට සඟින් ආරාධනා කළ යුතුයි. සඟින් ආරාධනා කරනව කියන්නේ විහාරස්ථානයක ඉන්නව '**බත්උද්දේසක**' භික්ෂුවක්. බත්උද්දේසක කියන්නේ බත් උදෙසන කියන එක. ඒ කියන්නේ ආහාර භාරගන්නේ නැත්තන් අපේ වචනයෙන් කිව්වොත් දාන ආරාධනා කරන භික්ෂුව ඉතින් බත්උද්දේසක කියන්නේ කව්රු හරි පංසලේ ලොකු හාමුදුරුවෝ හරි පොඩි කෙනෙක් දෙවැනි හාමුදුරුවෝ හරි දානේ ආරාධනාව භාර ගන්න භික්ෂුව ඉන්නවනේ ඉතින් සංඝයානේ සම්මත කරල ඉන්නේ බත්උද්දේසක භික්ෂුවක ඒ විහාරෙ සංඝයානේ හැමෝම භාර ගන්න යන්නෑනේ දාන. අන්න ඒ බත්උද්දේසක භික්ෂුව හම්බ වෙලා කියන්න ඕනි අපි සාංඝික දානයක් දෙනව පුළුවන්නම් ස්වාමීන් වහන්සේල වැඩම කරල දෙන්න කියන්න ඕනි. ගානක් කියන්නේ නැතුව ඉතින් අපිට එහෙම සාංඝික දාන දෙන්නත් අමාරුයිනේ හාමුදුරුවෝ වැඩියොත් එහෙම පනස් නමක් විතර අපි ගේ ඇතුලේ වාඩි වෙන්නවත් ඉඩ නැනේ. එහෙම නැත්තන් ආරාධනා කරන්න ඕනි කොහොම ද? ස්වාමීන් වහන්ස අපිට මෙන්න මෙච්චර ස්වාමීන් වහන්සේල වැඩම කරල දෙන්න එකනමක් හරි දෙනමකට පුළුවන්නම් උදව් කරන්න. දෙනමක් හරි පස් නමක් හරි දහනමක් හරි විසි නමක් හරි අන්න ආරාධනා කරන්න ඕනි. ආරාධනා කරන කොට අපිනම් අනිවාර්යෙන් බලනව ලොකු හාමුදුරුවො ඉන්නෙ කවද්ද? සාංඝික දානෙ දෙන්න පොඩි හාමුදුරුවෝ හිටියට පොඩි හාමුදුරුවෝ පංසලේ ඉන්නවනේ කොහොමත් අපි අනිවාර්යෙන් බලනව ලොකු හාමුදුරුවෝ ඉන්නේ කවදද? උන්

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

වහන්සෙට නිවාඩුනම් එහෙම ඔබ වහන්සෙත් ඉන්න දවසක අපි දාගමු. මෙ දානය අපි සාංඝික කියන නමින් අපි පූජා කරන්නේ ලොකු හාමුදුරුවෝ ඇතුලු දන්න කියන භික්ෂූන්ටය. කෙටියෙන් කියනවනම් මේකේ බෝඩ් එක විතරයි. සාංඝික කියන ගාථාව විතරයි. සාංඝික දානේ සාංඝික නැත. එහෙම ආරාධනා කරන්න බැහැ. හාමුදුරුවෝ වෙන් කරල අපිට මෙච්චර හාමුදුරුවෝ ලබා දෙන්න එච්චරයි. ඊට පස්සේ අපි අරහේ පංසලටත් ආරාධනා කරනව හාමුදුරුවනේ. එහෙම ආරාධනා කරල හරියන්නේ නෑ. ඒ පංසලට ආරාධනා කරන්නේ අපේ හිතවත් කම අනුවනේ තව ළග ආරන්‍යක් තියෙනව ඉතින් ආරන්‍යයේ හාමුදුරුවො වැඩම කර ගත්තොත් දානෙට පුදුම වටින කමක් උන්වහන්සේ හරි සීලවන්තයි. ගුණවන්තයි. ඉතින් උන්වහන්සේටත් ආරාධනා කරල වැඩම කරවගෙන එනව දැන් මොකද? දානේ තත්වය තමයි පුද්ගලික දානයක්. ඇයි අර හාමුදුරුවන්ට භාර දෙනව මිස අවශ්‍ය ස්වාමීන් වහන්සේල වැඩම කර දෙන්න නියම කරල දෙන්න බෑ. කොයි හාමුදුරුවන්ට එන්න කියන්න ද, කොයි පංසලට කියන්න ද? අරේහේට කියන්න ද, මෙහෙට කියන්න ද? සාමණේර අය ඕනි ද? උපසම්පදා අය ඕනි ද? ලොකු අය ඕනි ද? පොඩි අය ඕනි ද? ඒව කියන්න බෑ. ඒ හාමුදුරුවෝ ඕනි හාමුදුරුවෝ කෙනෙක් එවන්න ඕනි එච්චරයි. එහෙම එව්වට පස්සේ ඒ ස්වාමීන් වහන්සේ පිළිගෙන අපි සාංඝික දානේ දෙන්න ඕනි. දැන් බලන්න අපි සාංඝික දානයට හාමුදුරුවො වැඩම කරගෙන යන්න එනව. වාහනයකින්නේ අද එන්නේ. මං ඉතින් ඉස්සර ක්‍රමේ කියන්නෑ. වාහනයකින් අපි එනව. දූන් ඇවිත් නවත්තනව. දැන් ඔන්න දානෙට පොඩි හාමුදුරුවෝ කට්ටියක් විතරක් වැන් එකක එනව. ලොකු හාමුදුරුවොත් නට සාංඝික දානයක් තියෙනව. ඒ වැන් එකට නගිනව. දායකයගේ මූණ කෙහොම ද? සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. ඇඹුල් වෙලා. කේන්ති ගිහිල්ල. දොම්නස් වෙලා බලන්න සාංඝික දානේ කිව්වට

කිසිම අවබෝධයක් නැතුව මේ අන්ධයෙක් ගමනක් යනව වගේ පින්කම කරන්නේ. කිසිම දැනුමක් නෑ බලන්න එතකොට සංඝයා කියල හිතාගෙන ඉන්නේ තුන් කාලේ අයිති සංඝයාට. දානේ දෙන්නේ දූන් සංඝයා වෙන්කර ගන්නව. හාමුදුරුවෝ අපේ දානෙට වඩින්න ඕනි. නැත්නම් ඉස්කෝල් හාමුදුරුවෝ අපේ දානෙට ඕනි. අඩු ගානේ වෙන ලොකු හාමුදුරුවෝ කෙනෙක් හරි ගෙන්වල ඕනි. නැත්තන් මෙක පිළිවෙලට කරන්න බෑ මේ පොඩි අයට. ආං බලන්න අපේ ප්‍රාර්ථනාව අපේ කල්පනාව. ඒ කියන්නේ අපේ දානය සාංඝික වන්නේ නැත. අපි කැමති ස්වාමීන් වහන්සේල එක්කගෙන එන්න අපිට පුළුවන් කමක් නැහැ. හැබැයි හාමුදුරුවෝ අපෙන් උදව් ඉල්ලුවොත් කිව්වොත් එහෙම එහා පංසලටත් ගිහින් කියන්න දෙනමකට වඩින්න කියලඅන්න අපි දෙනමකට වඩින්න කියල හාමුදුරුවන්ගේ වචනෙන් ගිහින් කියනව. ඒත් අපි කියන්නේ අහවල් ස්වාමීන් වහන්සේ කිව්ව දෙනමක් මේ පංසලෙනුත් ආරාධනා කරන්න කියල උන්වහන්සේගේ ආරාධනාව මතක් කරන්න ආවේ ස්වාමීන් වහන්ස එච්චරයි. අපි නෙමේ ඒ ආරාධනාව කරන්නේ අර හාමුදුරුවෝ වෙනුවෙන් අපි නියෝජිතයෙක් විතරයි. අපි ආරාධනා කරන්න ගිහිල්ල සාංඝික බව නැති කරගන්නේ නැහැ. මෝඩයෙක් බවට පත්වෙලා මේ පින්කමේ වටිනාකම නැති කර ගන්නේ නෑ. අපි ආරාධනා කරන්න යන්නෑ. ආයේ අපේ නෑදෑයෝ වෙන හාමුදුරුවන්ට අපි අඳුරන හාමුදුරුවන්ට අපි උදව් උපකාර කරන ගුණවන්ත සිලවන්ත හාමුදුරුවන්ට කියල ඒ කාටවත්ම කියල පුද්ගලිකව ආරාධනා කරන්නේ නැත. එහෙම ආරාධනා කළොත් දානය සාංඝික වන්නේ ද නැත. ඒක හොඳට මතකෙ තියා ගන්න ඕනි. ගොඩක් ඇත්තෝ දෙන දාන සාංඝික දාන නෙමෙයි ද කියල දහස්වරක් විතර හිතන්න වෙනව මං ඒකයි මුලින්මත් එහෙම කිව්වේ.

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

ඊළඟට දැන් දානෙට අපි ස්වාමීන් වහන්සේල වඩිනව. වඩින කොට අපි හිතමු අපි සිවුරු පූජා කරනව. දැන් මේ සිවුරු පූජ කරනකොට දහනමකට ආරාධනා කලානම් සිවුරු දහයක් හැදුවට කමක් නැහැ මොකද උපස්ථාන කරන්න පුළුවන් ගානටනේ ස්වාමීන් වහන්සේල වැඩම කරවා ගන්නේ. ඒක නිසා අපි හිතමු පංසල් තුනකින් වඩිනව දැන් අපි සිවුරු පිරිකර තියෙනව අටපිරිකර තියෙනව. අඩුම ගානේ පංසල් තුනකින් ලොකු හාමුදුරුවෝ තුන් දෙනෙක් වඩිනවනම් අපි අටපිරිකර කියක් ලෑස්ති කරනව ද? අටපිරිකර තුනක් ලෑස්ති කරනව. අපි හිතමු සමහර ස්වාමීන් වහන්සේල අඳින්නෙ දුඹුරුපාට සිවුරු. සමහර අය අඳින්නේ තැඹිලිපාට සිවුරු. සමහර අය අඳින්නෙ කහපාට සිවුරු. ඉතින් අපි වඩින හාමුදුරුවො අනුව කල්පනා කරනව කහපාට සිවුරු අඳින දෙනමයි. අහවල් හාමුදුරුවෝ අඳින්නේ දුඹුරුපාට එකක් අහවල් කෙනා අඳින්නේ තැඹිලිපාටට වගේ හුරු සිවුරක් අපි ගන්නේ නැද්ද හාමුදුරුවෝ අඳින විදිහට සිවුරුටික ගන්නව. දැන් පිරිකර ගන්න කොට පන්සල් තුනට විහාරාධිපති ස්වාමීන් වහන්සෙලට අටපිරිකර තුනක් ගත්ත. ඒ ඒ සිවුරු අඳින හාමුදුරුවන්ට අනුව සිවුරු තුනක් ගත්ත. සිවුරු ඕන්නෑ බාටා ගන්නව කියල හාමුදුරුවන්ගේ කකුලේ ප්‍රමානයට නෙමෙද ඒ පාවහන් ගන්නේ. හාමුරුවනේ කියද සයිස් එක. හාමුදුරුවන්ගේ කකුලක් මැනල ගේන්නේ සංඝයාට දෙන්න නෙමේ හාමුදුරුවන්ටම දෙන්න. කකුල මැනගෙන එන්න ඕනිද සාංඝික දාන දෙන්න. ඒ තමයි ඇත්ත කතාව. අර විදිහට අටපිරිකර අහවල් තැනට අහවල් තැනට කියල ගත්තත් සාංඝික වෙන්නේ නැහැ. ඇයි හිතේ තියෙන්නෙම අර පංසලට එකයි මේ පංසලට එකයි එහා පංසලට එකයි සාංඝික වෙනව ද? වාක්‍යයෙන් විතරක් සාංඝික කරන්න බැහැ. සිවුරු වල පාට තීරණය කරල සිවුරු ගත්තත් සාංඝික වන්නේ නැත. එක එක හාමුදුරුවන්ට ඕනි ඕනි දේවල් වෙන වෙනම හදනව. එතකොටත් මේ දානය සාංඝික වෙන්නේ

නැහැ. ඇයි පුද්ගලිකවනේ වෙන වෙනම හදන්නේ මේ අපේ තියෙන අඩු පාඩු. මම මේ කතා කරන්නේ අපේ පංසලේ දානේ දෙන්නෙත් එහෙම තමයි මිනිස්සු. මං මේ සම්ප්‍රධායට විරුද්ධව කතා කරනව නෙමේ. මේක බොහොම අර්ථවත්ව අපි කරන ලොකුම පිංකමනේ අද කාලේ. ඒ කාලේ මිනිස්සු කළ ලොකුම පින්කම භාවනා කළ එක ඉතින් පස්ගෝ රස නැති වෙච්ච කාලෙකට බුදුරජාණන් වහන්සේ කිව්වනේ මිනිස්සු යවහාල් පිටි කනව කියල. ඒ කියන්නේ තිරිගු පිටිත් කනව කියල. අපි දානට කන්නේ අන්න ඒ වගේ පිරිහීමත් එක්ක අපි දානට කරන ලොකු පින් කමක් අපේ තියෙන ලොකුම පින්කම වෙලා තියෙන්නේ ඒකනේ එතනින් එහාට අපි ගිහිල්ල නැහැ. මෛත්‍රී භාවනාවක් කරන්න බුදුගුණ භාවනාවක් කරන්න ත්‍රි ලක්ෂණය මෙනෙහි කරන්න එතනින් එහාට ගිහිල්ල නෑ අපි. ඉතින් අපි දානට කරන ලොකුම පින්කමවත් ලොකුවට හරියට කරගන්න උපදෙස් ලබා දීමක් විදිහටයි මා මේ ධර්ම දේශනාව කරන්න අද කල්පනා කළේ. මේක හරියට ම කරන්න ඔබට උපදේශයක් ලබා දීමට. ඒක නිසා දහනමක් වඩිනවනම් පිරිකර දහයක් ලෑස්ති කරන්න. ආයේ අහවල් පංසලට අහවල් පංසලට කියල වෙනම පිරිකර හදන්න යන්න එපා. අහවල් හාමුදුරුවන්ට මේ දේ ඕනි අහවල් හාමුදුරුවන්ට මේ දේ ඕනි අරයට ඕනි මේක එහෙම කියල නෙමේ පුද්ගලික දාන දෙනකොට පංසලට දාන දෙනකොට එහෙම දෙන්න සාංඝික කරනකොට වෙන වෙනම සකස් කරන්න යන්න එපා. විශේෂත්වයක් එපා. අට පිරිකර පූජා කරන්න කැමතිනම් අටපිරිකරක් ගන්න කමක් නැහැ. ඒ ලොකු හාමුදුරුවන්ට අටපිරිකරක් තියනව කියන අදහසින් ගන්න එහෙම එපා. සංඝයාට අටපිරිකරක් පූජා කරනව මම අටපිරිකර දෙකක් පූජා කරනව මේ සැරේ මහා සංඝයාට එහෙම කියල අටපිරිකර දෙකක් ගන්නව මිසක් අනේ විහාර තුනකින් වඩිනවනේ අටපිරිකර දෙකක් මදිනේ අන්න හිතුවොතින් ඒ සිතුවිල්ල ඇති ඔබේ පින දුර්වල එකක් බවට පත්

කරන්න. එහෙම නැතුව පිරිකර දැන් ලෑස්තිකරන විදිහ හොඳට තේරෙන්න ඇති කියල මම හිතනව. අහගෙන හිටියනම් නිවැරදිව තේරෙන්නට ඇති.

අපි හිතමු දහනමකට දැන් ආරාධනා කලා මොකද ගණන් වශයෙන් ආරාධනා කරන්න පුළුවන්නේ හාමුදුරුවෝ පංසලෙන්ම වඩින්නම් කිව්ව අපේ වාහනය එන්න ඕනි නෑ. හාමුදුරුවන්ගේ කකුල් හෝදන්න බලාගෙන ඉන්නකොට පස් නමක් ඇවිල්ල බහිනව. දැන් මොකද වෙන්නේ දහ නමකට ආරාධනා කරල පස් නමක් ආවොත් හිත තියෙන සතුට හරියනව ද සතුට පවතින්නේ නැහැ. ඇයි? මේ දහ නමකට ආරාධනා කළේ දහ නමකට උපස්ථාන කරන්න පුළුවන් හන්ද මිස දහ නමකට විතරක් දෙන්න නෙමේ. දෙන්නේ දානේ තුන් කාලයට අයිති සංඝයාට අන්න පිරිස අඩු උනා කියල හිත දූෂිත උනා. ඒ කියන්නේ එයාගේ හිත සංඝයාට දෙන අදහසක් නැත. දහ නමකටම දෙන්න ඕනි කොහොම හරි මේ සැරේ ඒකනේ හිතේ තිබිල තියෙන්නේ. හරියන්නැ එහෙම දූෂිත උනානම් සාංඝික වෙන්නේ නැහැ. මං දහනමකට ආරාධනා කළේ මට පුළුවන් හන්දයි. ඒ උනාට අද මං උපස්ථාන කරන්නේ තුන් කාලයටම අයිති සංඝයාටනේ ඒකට එක නමක් වැඩියත් ඇති. එහෙම හිතන්න තියෙන්නේ සමහර වෙලාවට එහෙම වෙනව. මට මතකයි මම ඉස්සර දානයක් ලෑස්ති කලා මට හම්බවෙච්ච පිරිකර එහෙමත් එකතු කරල ලොකු දානයක්. ඒ දානේ දස දාන වස්තු පූජා කරන දානයක්. ඒ කියන්නේ බුද්ධ සාසනයේ දන් දෙන්න පුළුවන් දහයක් තියෙනවනේ දස දාන වස්තු දහනමකට පූජා කරන්න ඕනි කියල දානයක් ලෑස්ති කලා. ඉතින් එදා එක එක තැන්වල දාන යෙදිල. එදා කඨිනෙත් එක්ක. හාමුදුරුවෝ දහනමකටයි ආරාධනා කළේ. මං හිටපු පොඩි පංසලක් අපිට පුළුවන් විදිහට හාමුදුරුවෝ වැඩම කළේ දෙනමයි. ඉතින් දැන් මිනිස්සුන්ට හරි

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

ප්‍රශ්ණයක්. මිනිස්සු කිව්වේ දහනමකට ආරාධනා කලාට කඨින දානයක්නේ පහලොස්නමක්වත් වඩියි. පොඩි හාමුදුරුවොත් එක්ක දානෙට වැඩියේ දෙනමයි. ඇත්තටම මම කල්පනා කලා දූන් මේ සංඝයාට සංඝයාට පූජා කරන්න ලැබෙනව එකත් ඒ සාංඝිකව. ඊළඟ කාරනාව තමයි හාමුදුරුවන්ට ලැබෙන පිරිකර ටික. දූන් කොටස් දෙකකට බෙදලනේ පූජා කරන්න වෙන්නේ. ඇත්තටම හාමුදුරුවෝ ඉන්න මේසේ පිරිකර තිබ්බහම අර දස දාන වස්තුනේ. එක නමකට පරිස්කාර දහයක් හම්බෙනව. දස දාන වස්තු කියල ඉතින් හාමුදුරුවෝ වැහෙන්න පිරිකර ඇයි දෙනමකටනේ. දහනමකට තියෙන පිරිකර දෙනමකට තිබ්බහම. අන්න එහෙම එක නමකි වැඩියත් හිත හදා ගන්නව මිස හිත දූෂිත කර ගන්නවනම් ඒ දානේ සාංඝික වෙන්නේ නම් නැහැ. ඒක හොඳට මතකේ තියා ගන්නට ඕනි. මේ දහනමකට උපස්ථාන කරන්නන පුළුවන් හන්ද මිස දහනමකට දන් දෙන්න නෙමේ දහනමකට ආරාධනා කළේ තුන් කාලවර්ති මහා සංඝයාට දන් දීමටයි.

ඊළඟ කාරණාව අපේ දානයට වඩින්නේ දුස්සීල භික්ෂු පිරිසක් නම් අපි කියමු කව්රු හරි ප්‍රසිද්ධයි මිනියක් මරල තියෙනව නැත්නම් ස්ත්‍රී දූෂනය කරල තියෙනව මංකොල්ලයක් කරල තියෙනව සමහර අය එහෙම කරල නැති උනත් සමහර අය එහෙම ප්‍රසිද්ධ වෙලා ඉන්නවනේ එහෙම කලා කියල. කලාද නැද්ද කියල අපි දන්නෑ. අපි හිතමු මෙයාලට අඹු දරුවෝ එහෙම සිටිනවා. ඉතින් ඔය වගේ භික්ෂුවක් හෝ අපේ නිවසට වඩිනව සාංඝික දානයට. දූන් අපි දන්නෑ මේ කියන චෝදනාව හරිද වැරදිද එහෙම චෝදනා කරන්නත් හොඳ නෑ. කරනවනම් ඇහෙන් දූනල කලානම් කමක් නැහැ. අම්ම කිව්ව කියල ඒ චෝදනාව කරන්න හොඳ නැහැ. තාත්ත මට කිව්වේ එයා බොරු කියන්නේ මගේ යාළුව කිව්වේ අපේ පුතා කිව්වේ, මගේ නෝන කිව්වේ අපේ මහත්තය කිව්වේ. එහෙම කියලවත්

හාමුදුරු කෙනෙකුට දුශ්ශීල බවින් චෝදනා කරන්නේ නැහැ. ඇහෙන්ම දකින්න ඕනි ඇහෙන්ම දැකල චෝදනා කරන්නේ නැතුව බැරිවෙලාවත් බොරුවක් උනොත් එහෙම ඔය දක්තම කියල කියන කෙනා, දක්ක කියන කෙනා හරියට හොයාගෙන ගියොත් එයාගේ යාළුවෙක් දක්කම කිව්වට තවත් හොයාගෙන ගියොත් ඒක දකල තියෙන්නේ ඒ යාළුවගේ යාළුවෙක්. සමහර වෙලාවට දකල තියෙන්නේ මහ ලොකු දෙයක් කියල කිව්වට මේ පිරිත් නූලක් හරි බඳින්න ගිය වෙලාවක අතින් අල්ලනව මහාලොකු දෙයක් කලා කිව්වට ඒ වගේ පොඩ් දේවල් මේ මිනිස්සු මහා ලොකුවට ගන්නේ. අපිත් මේකේ අගක් මුලක් නොදන අපිත් චෝදනාවක් කරනව චෝදනාව බැරි වෙලාවත් බොරු උනොත් මොකද වෙන්නේ දස දඬුවම් වලින් එකක් මෙලොව දී ලැබෙනව.

දස දඬුවම් සියල්ල මට මතක නැහැ. ඒකේ මම කිහිපයක් කියන්නම්.

වේදනං ඵරුසං ජානිං

ශරීරස්සච භේදනං

ගරුකංවාපි ආබාධං

චිත්තක්කේ පංච පාපුනේ

ඔන්න කීපයක් මේ බුදුරජාණන් වහන්සේ කියන. භික්ෂුවකට චෝදනා කරනව මෙන්න මේ චෝදනා හතර. හොරකමක් කලේය හොරෙක්ය කියල නැත්තන් ස්ත්‍රී දූෂකයෙක්, ස්ත්‍රියක් සමග වැරදි හැසිරීමක දුරාචාරයක යෙදුනේය කියල එහෙම නැත්තන් මිනියක් මැරුවේය, මනුස්ස විග්ගහ එහෙම නැත්තන් නැති සෘධිබල ඇතැයි ප්‍රකාශ කලේය. මෙන්න මේ හතරෙන් චෝදනාවක් කරනවනම් හරියටම දන්නේ නැතුව මෙලොව ලැබෙන දස දඬුවම් මොනව ද? ලැබෙන දඬුවම් 'වේදනං ඵරුසං' දරුණු වේදනාවක් හට ගන්නව

Ven Doloswala Udithdeera Thero https://www.nipunadhamma.org

වෛද්‍ය පරීක්ෂණයක් කලාට හොයා ගන්න බැහැ. ඒ උනාට රිදෙනව. සමහර අයට බෙහෙත් ගන්න ගියාම දොස්තරල කියන්නේ එයාගේ හිතේ තියන ප්‍රශ්ණයක් ලෙඩාට මේක හිතේ ද තියෙන්නේ ගතේ ද කියල වැඩක් නැහැ. ලෙඩාට තියෙන්නේ කැක්කුමක් තියෙනවනම් බෙහෙත් විතරයි මේක කායික ද? මානසික ද? කියල දොස්තර කෙනෙකුට කිව්ව කියමුකෝ තව දොස්තර කෙනෙක් ඔයාගේ ඔය ලෙඩේ තියෙන්නේ හිතේ ඕක කායික එකක් නෙවේ. දොස්තරට ඒක තේරුම් ගත්තට මේ ලෙඩේ සනීප කරගන්න බැරි උනොත් එහෙම පීඩා විඳින්නේ නැද්ද? මේ දොස්තර එයා පීඩා විඳිනව ඕක ගෙදර අයට කිව්වට පස්සේ මෙයා පිස්සෙක් කරල දානවනේ මේක හිතේ විතරයි මේ ලෙඩේ තියෙන්නේ එයා හිතනව වැඩි මේක කායික ද? මානසික ද? කියල එච්චරම වැඩක් වෙන්නෑ. මේකට මොකක් හරි ප්‍රතිකර්මයක් ඕනි. මානසික එකක් නම් මනස තුලින් දෙන ප්‍රතිකර්මයක් හරි කායිකනම් කායික ප්‍රතිකර්මයක් හරි ඇත්තටම අවශ්‍ය වෙන්නේ ඒකයි.

කොහොම හරි ඔන්න ඔය සනීප කර ගන්න බැරි වේදනාවක් නැත්තන් '**සරීරස්ස වේදනං**' ඉල ඇටයක් කැඩෙනව, අත්පා කැඩෙනව, කොඳු ඇට බිඳෙනව, උකුල් ඇට බිඳෙනව අන්න ඒ වගේ වැරැද්දක් කලොත් වැරැද්දක් නැතුව චෝදනා කළොත් එහෙම ඒ වගේ '***ගරුකං වා ආබාධං***' සනීප කරගන්න බැරි පිළිකාවක් හරි වෙන දරුණු අංශභාගය වැනි රෝගයක් හරි මොකක් හරි හැදෙනව. ඒ වගේම '**චිත්තක්ඛේපං ව පාපුනේ**' නැත්තන් පිස්සු හැදෙනව, උමතු වෙනව ඒ වගේම ධනය නැති වෙනව නැත්තන් තමන්ගේ දරුව හරි නෝනා හරි අඩුවයසින් මැරිල විඳවන්න වෙනව. එක්කෝ සහෝදරය හරි මහත්තය හරි මැරෙනව. ඔය වගේ ඉතාම දරුණු කාරණා දහයක් දේශනා කරල තියෙනව සර්වඥයන් වහන්සේ. ඒ හන්ද ලේසි නෑ මේ භික්ෂූන්ට හරියට ඇහෙන් දකින්නැතුව කරන චෝදනාව. අපේ

ඇත්තෝ මේ චෝදනාව කරන්නේ ඇහෙන් දැකල ද? ඇත්තටම නැහැ. දැක්කලු කෙනෙක් එයා බොරු කියන්නෑ ඒක වරදක් නැහැ බොරු කියනවද නැද්ද කියන එක. ඒක හන්ද හොඳට මතක තියාගන්න මේ කියපු කාරණා ටික. නැත්තන් ඔබ මෙලොවත් දුක් විඳල මරණින් මතු නිරයෙනේ ඉපදෙන්නේ. බිම ගව්වක් වැඩෙනකන් නිරයේ ඉපදිලා ඉන්න වෙයි. හැතැප්ම දාසයක් උසට පොළොව වැඩෙනකන් මහා නිරයේ දුක් විඳින්න සිද්ධ වෙයි. ඉතින් අඩියක් වැඩෙන්න ගත වෙන්නේ විනාස උනේ නැත්තන් අවුරුදු දාහක්. ඉතින් බිම හත් ගව්වක් වැඩෙනකන් නිරයේ ඉන්න උනොත් කොච්චර කාලයක් ද? ඉතින් ඒක නිසා ඉතාම දරුණුයි. ඒක තේරුම් අරගෙන හොඳට මතකේ තියාගන්න මේ කාරණාව ආර්ය සංඝයාට වඳින අදහසින් ඇයි මේ තුන්කාලයටම අයිති සංඝයා නියෝජනය කරන්න වැඩ ඉන්න භික්ෂු පිරිස මේ පිරිස නැති උනොත් කව්ද මේ ශාසනය රැක ගන්නේ. ඉතින් ඒක නිසා තුන් කාලයටම අයිති මහා සංඝ රත්නයට නමස්කාර කරමි! නමස්කාර වේවා! කියලම වඳින්න සඟ සතු දානයක් වගේ පින් ලැබෙයි. ඔබේ ජීවිතයට ඉතින් ඒක නිසා ඉතාම වටිනව ඒක කොහොමහරි අර වැරදියි කියල හිතන ස්වාමීන් වහන්සේල එනව. අනේ අපේ දානෙට ඇවිත් තියෙන්නේ බොහොම සවුත්තු ටිකක්නේ කියල හිතුනොත් සාංඝික දානේ පින් සිද්ධ වෙනව ද? නැත. මොකද ඉස්සරහට අපේ දානෙට වැඩම කරන්නේ කව්ද? ඉස්සරහට වාහනේ ගිහිල්ල නවත්තල වැඩම කරගෙන එන ස්වාමීන් වහන්සේලට වඩින්න කියල උපාසක මහත්තයට මතක් කරනව උපාසක මහත්තයට නෙවේ මතක් කරන්න වෙන්නේ උපාසිකාවකට මතක් කරන්න වෙන්නේ. නැත්තන් පුතෙකුට එයා ගෙට ගිහින් කියනව අපේ අවසර වැඩම කරන් යන්න ඇවිල්ල එළියට එන්නේ කව්ද? කහ නූලක් බැඳ ගත්ත කාසාව කණ්ඨකයෙක් ඒ කියන්නේ එයාගේ නෝන ඉස්සෙල්ල ආවේ අපි පණිවිඩේ කිව්වේ එයාගේ ළමයට නැත්තන් පණිවිඩේ කිව්වේ එයාල

අඹුදරුවන් ඉන්නව කාසාව කණ්ඨකයෙක් කහනූලක් විතරක් බැඳ ගත්ත. මේ ශාසනය අතුරුදහන් වෙන කාලෙදී මං මේ කියන්නේ එයා අඹුදරුවන් පෝෂණය කරමින් ගොවිතැන් බත් කරමින් සාමාන්‍ය ජීවිතයක් ගත කරනව. ඉතින් කාසාව කණ්ඨකයෝ වැඩම කරවාගෙන ඇවිල්ල තමයි ඒ කාලේ අපිට පාවඩ බැඳල උඩු වියන් බැඳල සඟ සතු දාන දෙන්න සිද්ධ වෙන්නේ. මේ තාත්තල ටිකට වන්දනා කරල ඇයි ළමයි ඉන්නවනේ තාත්තලනේ. ඒ තාත්තල කහ නූල් බැඳගෙන ඉන්නේ එයාලට තමා අපිට දානය පූජ කරන්න සිද්ධ වෙන්නේත සාසන අන්තර්ධහනෙ දී තව අවුරුදු ගානකින් බුදුරජාණන් වහන්සේ වදාල ***"භවිස්සනි බෝ පනානන්ද අනාගත මද්ධගානං කාසාව කණඨා දුස්සීලා පාප ධම්මා තේ දුස්සීලෙසු සංඝං උද්දෙස දානං දස්සන්ති"*** ආනන්ද අනාගතයේ කාසාව කණ්ඨකයෝ පහල වෙනව දුස්සීලයි පව් කරනව එයාල එක්කගෙන ඇවිල්ල සංඝයාට කියල දන් දෙනව. ***"තදා පාහං ආනන්ද සංඝගත දක්ඛිනං අසාඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි"*** ආනන්ද එකල්හිත් සංඝගත දක්ෂිනාව අසංඛෙය්‍යං ඒ කියන්නේ සංඛ්‍යා කල නොහැකි පිනක් යැයි කියමි. ***'අප්ප මෙය්‍යං'*** ප්‍රමාණ කළ නොහැකි පිනක් යැයි මම කියමි. අන්න බලන්න කාසාව කණ්ඨකයෝ එක්කගෙන ඇවිත් දානේ දුන්නත් සඟ සතු දානේ මහත්ඵලයි මහානිසංසයි. එහෙනම් ඉතින් අපි හිතන අපි දැකලත් නෑ කාසාව කණ්ඨකයොත් නෙමෙයි. අපි හිතන භික්ෂූන් වහන්සේල වැඩම කරල දානේ දුන්නට ප්‍රශ්ණයක් නැහැ. ඊළඟට ධර්මයේ ප්‍රශ්ණයක් අහනව දුස්සීලයෝ එක්කගෙන ඇවිල්ල සාංඝික දානේ දුන්නොත් ඒ දානේ මහත්ඵල වෙන්නේ කොහොමද? දුස්සීලයන්ටනේ දානේ දුන්නේ. එහෙම ප්‍රශ්ණයක් අසනව ධර්මය තුළ ඒක අහන්නේ මෙහෙමයි.

"සංඝෝහි දුස්සීලෝ නාම නත්ථි" සංඝයා අතර දුස්සීලයෝ නැත. මොකද සංඝ කියන වචනේ දුස්සීල නැහැ. ඊළඟට ***'දුස්සීලා පන උපාසිකා'*** දුස්සීල උනොත් එයා සංඝ නෙමේ උපාසක කෙනෙක්

පමණි. '**තේසු දුස්සීලේසු භික්ඛු සංඝං උද්දිස්ස දේමාති දානං දස්සන්ති**' ඒ දුස්සීලයන්ට ඒ උපාසකවරුන්ට සංඝයා උදෙසා කියල දානයක් දෙනව සංඝගතා දක්ඛිනා නාම ඒත් ඒ දානය සංඝ ගත දක්ෂිනාව කියලමයි හඳුන්වන්නේ. ඉතින් ඒ දුස්සීලයන්ට දෙන දානය මහත්ඵල මහානිසංස කරන්නේ කව්ද? ඒකට පිළිතුරු දීල තියෙනව '**සාරිපුත්තාන මොග්ගල්ල නාදි ථේරං**' කියල ඒ දානේ මහත්ඵල මහානිසංස කරන්නේ කව්ද? සැරියුත් මුගලන් ආදි මහා තෙරුන් වහන්සේල ඇයි උන්වහන්සේල ඉන්නවනේ මේකේ මුලට අතීත සංඝයා කියල කියනකොට උන්වහන්සේල මහත්ඵල කරන්නේ. සිවුරු ඇදගෙන එන උපාසක මහත්තරුන්ට දානේ දුන්නත් සාරිපුත්ත මොග්ගල්ලානා දි තෙරුන් වහන්සේලටනේ දානේ පූජ කරන්නේ. ඒක නිසා උන්වහන්සේල දානේ මහත්ඵල මහානිසංස බවට පත් කරනව. අපි දැන් දානේ සාංඝික කරල ඉවරයි. දැන් පිරිකර තියෙනව ඊට පස්සේ අපි දැන් මොකද කරන්නේ. අපි මේ පිරිකර අරගෙන අපි කැමති හාමුදුරුවරුන්ට පූජ කරනව. අටපිරිකර ගත්තම අපි කැමති මේක ලොකු හාමුදුරුවන්ට දෙන්න. ඊට පස්සේ කවුරු හරි මේ වයසක කෙනෙක් අටපිරිකර පූජ කරන්නේ මැරෙන කොටවත් මතක් වෙන්න කියල ඉතින් මේ වයසක අම්මලට මතක නෑ අටපිරිකරත් දීල යනකොට එයා යනව දැන් ලොකු හාමුදුරුවො කෙනෙක් ළඟට යන්නැතුව වෙන හාමුදුරුවො කෙනෙක් ළඟට. දැන් මොකද කරන්නේ ඉක්මනින් ගිහිල්ල පිටිපස්සෙන් අල්ලල කිහිලිවලින් අල්ලල ලොකු හාමුදුරුවෝ ළඟට හරවන්නැද්ද? හරවනව ලොකු හාමුදුරුවන්ට පූජ කරන්න.

ඒ කියන්නේ දානේ දීපු කෙනාගේ අදහසක් තිබිල තියෙනව මේ පිරිකර නායක හාමුදුරුවන්ට ඒ වගේම මෙයා මේක පූජ කරල නැද්ද සාංඝික කරපු වෙලාවේ පූජ කලානම් එයාට පුළුවන් ද මේක අරගෙන තව කෙනෙකුට දෙන්න එක හාමුදුරුවො කෙනෙකුට හරි. බලන්න පොඩ්ඩක් කල්පනා කරල ඔබ යමක් පූජ කලොත්

ඔබ හිතන්න දැන් සංඝයාට දෙනව කියල නැතුව අපි හිතමු මේ මහත්තයට කම්සයක් දෙනව. ඉතින් ඊට පස්සේ ඔබට පුළුවන් ද මේ කම්සය අරගෙන තව මහත්තෙකුට දෙන්න තව ටිකකින්? බෑ ඇයි? ඒක පූජ කරල ඉවරනේ. ඉතින් සාංඝික වාක්‍ය කිව්වම සංඝයට පූජ කරල ඉවරයිනේ තුන්කාලේ සංඝයාට. දැන් ඔබට පුළුවන් ද වෙන හාමුදුරුවන්ට පූජ කරන්න? ඇත්තටම මේක වැරදි ඇයි? අපිට අයිති නෑනේ මේක බෙදන්න. මේක තමයි යථාර්ථය. අපි මේ යථාර්ථය කතා කරන්න ඕනිනේ. බුද්ධ කාලේ කළේ මොකක්ද එහෙනම්. ඒ කාලේ කළේ සාංඝික කලාට පස්සේ එක ස්වාමීන් වහන්සේ කෙනෙක් ලොකු හාමුදුරුවන් ළඟට ගිහින් උක්කුටියෙන් වාඩිවෙලා අර එක පිරිකරක් අතින් අරගෙන ඒකට කියනව **'අපලෝකනං කරෝමි'** කියල. අපලෝකනං කියන්නේ විනය කර්මයක් . ඒ කියන්නේ සංඝයාට මේක බෙදල දෙන්න අවසර ලබා ගන්නව වාක්‍ය දෙකක් කියල. විනාඩියක්වත් යන්නැති වැඩක්. ඊට පස්සේ හාමුදුරුවො තමයි තීරණය කරන්නේ මේ සංඝයාට සමානව බෙදල දෙන්න කිසිම වෙනසක් කරන්නේ නැහැ. ලොකු හාමුදුරුවන්ට විශේෂයක් පොඩි එක්කෙනාට අඩුවෙන් වෙනසක් කරන්නෑ. සමානව පිරිකර බෙදල දෙනව. ඒ හාමුදුරුවන්ට තනියම කරන්න බැරිනම් ගිහි කෙනෙක්ගේ ආධාර ගන්නව. නිකන් කෙනෙකුට දුන්නම ඒක තව කෙනෙක්ට දෙන්න අයිතියක් නැත්තන් සංඝයාට දීපු දේ දෙන්නේ කොහොම ද? ඒක නිසා සංඝ ලාභය බෙදන්නේ අපලෝකන විනය කර්මයකින්. ඊළඟට ගරු භාණ්ඩ තියෙනවනම් මේස, ඇඳන්, පුටු ආදි දේවල් තියෙනවනම් පංසලට දීල ඉතුරු ටික බෙදල දෙනවා සංඝයා වහන්සේට අපලෝකන විනය කර්මයෙන්. ඉතින් මම ධර්ම දේශනාව නිමා කරනව. මේ කරුණු ටික මතක තියා ගත්තනම් ඒක ඔබට ඉතා වටිනා බව මතක් කරන ගමන්.